# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර - 2017

## සාක්ෂි නීතිය සහ අපරාධ නඩු විධානය

## පැ තුනයි (03)

**මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
**(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)**

---

01. මෙම ප්‍රශ්නයේ පහත සඳහන් කොටස් අතුරෙන් **එක්** කොටසක් සඳහා පිළිතුරු සපයන්න.

(i) "1997 අංක 30 දරණ ඇප පනත රටේ අපරාධ යුක්තිය පරිපාලනය සහ සැකකරුවන්ට යහපතක් වන ධනාත්මක අංග ලක්ෂණවලින් සමන්විත වුවද, පනතේ මාර්ගෝපදේශ මූලධර්මවලට පටහැනිව කටයුතු කරන බව පෙනෙන ඇතැම් විධිවිධාන තිබේ."

ඔබ එකඟවෙනවාද? ඇප දීමට අදාළව සංශෝධිත 1979 අංක 15 දරණ අපරාධ නඩුවිධාන සංග්‍රහයේ ඇති සහ ඇප පනතේ තිබෙන අදාළ ප්‍රතිපාදන සහ තීන්දු වූ නඩු ඇසුරින් විවේචනාත්මකව ඇගයීමට ලක්කරන්න.

(ii) "අපරාධ විමර්ශනය නීතියෙන් හසුරුවන ක්‍රියා පටිපාටියක් වන අතර එහි පරමාර්ථය වන්නේ වරදක් සිදු කර ඇති බවට චෝදනාව සම්බන්ධයෙන් සත්‍ය නිශ්චය කිරීම සහ තවදුරටත් අපරාධයේ වරදකරුගේ අනන්‍යතාවය, ඔහු අවනත කර ගැනීම සහ අනාගත අධිකරණ ක්‍රියාමාර්ගයන් සඳහා සාක්ෂි බවට පරිවර්තනය කර ගැනීමට හැකියාවක් ඇති විමර්ශනාත්මක තොරතුරු එක් රැස් කර ගැනීමයි."

අපරාධ විමර්ශනයක් සිදු කිරීමට අදාළ 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ ඇතුළත් නීතිමය ප්‍රතිපාදන ආධාර කරගෙන මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

02. මෙම ප්‍රශ්ණයේ පහත සඳහන් කොටස් **දෙකම** සඳහා පිළිතරු සපයන්න.

(i) ශ්‍රී ලංකාවේ චෝදනා ඒකාබද්ධ කිරීමට අදාළ නීතියෙහි තර්කානුකූලභාවය විවේචනාත්මකව ඇගයීමකට ලක් කරන්න.

(ii) පහත සඳහන් අවස්ථාවන්හි චෝදනා ඒකාබද්ධ කිරීමෙහි නීත්‍යානුකූලභාවය සාකච්ඡා කරන්න.

(අ) අකුරැස්ස නැමැති ගමෙහි සිටින ප්‍රසිද්ධ අපරාධකරුවෙකු හට චෝදනා නගා ඇත්තේ එකම ප්‍රදේශයේ තනි තනිව වාසය කරන ලද තරුණියන් පස් දෙනකු ඝාතනය කිරීම සම්බන්ධවය. මෙම තරුණියන් පස්දෙනා ඔවුන් එකිනෙකාට හඳුනන්නේ නැති අතර මෙකී ඝාතනයන් සිදු කර ඇත්තේ අඛණ්ඩව දින පහක් තුලදී ය.

(ආ) කමල්, සුනිල් සහ කරුණා බලහත්කාරයෙන් සිල්වාගේ නිවසට ඇතුළු විය. සිල්වාට තර්ජනය කිරීමෙන් පසු තුවක්කුවකින් සන්නද්ධව සිටි කමල් රු.200,000 ක් වටිනා මුදල් ඉවත් කර ගන්නා ලද අතර සිල්වාගේ බිරිය වන රාණිගේ රත්තරන් මාලය සුනිල් විසින් පැහැර ගන්නා ලදි. කරුණා සිල්වාගේ දියණිය වන සුගන්ධි කාමරයකට ඇදගෙන ගොස් දූෂණය කරන ලදි.

ඉහත සඳහන් වැරදි සම්බන්ධයෙන් කමල්, සුනිල් සහ කරුණා හට එකම අධිචෝදනා පත්‍රයෙන් චෝදනා නගා ඇත.

03. මෙම ප්‍රශ්නයේ පහත සඳහන් කොටස් අතුරින් **එක්** කොටසක් සඳහා පිළිතුරු සපයන්න.

(i) සාක්ෂි ආඥාපනතේ 14 සහ 15 වගන්ති යටතේ කරුණුවල අනුකූලතාවය පාලනය වන රීතීන් උදාහරණ ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

එසේම මෙම රීතීන් ඒවා අදාල වීමේදී වෙනස් වන්නේ කෙසේද?

(ii) "උසාවිය මගින් ආරවුල් විනිශ්වය කිරීමේදී සාක්ෂි නීතියේ ඇති රීතිමාලාව මගින් සහතික කරනු ලබන්නේ සත්‍ය කරුණු මත පදනම් වන බවට සහතික කිරීමයි."

සාක්ෂි නීතියෙහි ඇතුලත් නීති මූලධර්ම ආධාර කරගෙන මෙම ප්‍රකාශන සාකච්ඡා කරන්න.

(iii) පහත සඳහන් දෑ පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) ඍජු සාක්ෂි සහ පරිවේශණීය සාක්ෂි
(ආ) පරිවේශණීය සාක්ෂි සහ ප්‍රවාදක සාක්ෂි
(ඇ) මුල් සාක්ෂි (හොඳම සාක්ෂි) සහ දෙවැනි සාක්ෂි

04. මෙම ප්‍රශ්නයේ පහත කොටස්වලින් <u>**එකක්**</u> සඳහා පිළිතුරු සපයන්න.

(i) "චූදිත පුද්ගලයකු විසින් කරනු ලබන පාපොච්චාකරණයක් සාමාන්‍යයෙන් අදාළ කරලන හැක්කේ ඇතුළත් කර ගැනීමේ මූලධර්මය (inclusionary Principle) පිළිගැනීමෙනි. එසේ වුවත් අපරාධ කාර්ය පටිපාටියේ දී බැහැර කිරීමේ මූලධර්මය (exclusionary principle) නිසා සමහර සීමිත අවස්ථාවලදී පාපොච්චාරණය ඔප්පුකල හැකි තත්ත්වයකට පත් නොවේ."

ඉහත ප්‍රකාශනයෙහි වලංගුතාවය සහ බැහැර කිරීමේ මූලධර්මයෙහි යුක්ති සහගතභාවය අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකාවේ තීන්දු වූ නඩු ආශ්‍රයෙන් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(ii) වරදක් සම්බන්ධව වරදකරුවකුගේ අනන්‍යතාවය අදාළ කරුණකි. එසේ වුවද වරදකරුගේ අනන්‍යතාවය නිශ්චය කර ගැනීම ඕනෑම අපරාධ විමර්ශනයක වැදගත් අංගයකි.

වරදක් සිදු කරන ලද පුද්ගලයාගේ අනන්‍යතාවය තීරණය කිරීම සඳහා අධිකරණ ක්‍රියාවලියක් හරහා සිදු කරනු ලබන අපරාධ විමර්ශන ක්‍රියාවලිය ඇගයීමට ලක් කරන්න.

05. මෙම ප්‍රශ්නයේ පහත කොටස්වලින් <u>**එකක්**</u> සඳහා පිළිතුරු සපයන්න.

(අ) "Rex vs Lord Cochrane හි ඇලන්බරෝ සිද්ධාන්තය (Allenborough Dictum) ශ්‍රී ලංකාවේ උසාවි අනුගමනය කරන්නේ Woolvemington vs DPP සිද්ධාන්තය සමග එකිනෙකට අත්වැල් බැඳගෙනය."

ඉහත සඳහන් සිද්ධාන්තය සාක්ෂි ආඥාපනතේ 101 වගන්තිය ඇතුළත් පූර්ණ ඔප්පුකිරීමේ භාරයට සිදු කරනු ලබන බලපෑම විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

(ආ) නීති මූලධර්ම හා නඩු තීන්දු ආධාරයෙන් පර්වේශණීය සාක්ෂිවලට අදාළ අධිකරණමය වටිනාකම විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

06. "සංඥේය (cognizable) වරදක් සඳහා සැකකටයුතු වරදකරුවෙක් අත් අඩංගුවට ගැනීම කුමන හෝ අපරාධ විමර්ෂණයක අත්‍යවශ්‍ය අංගයකි."

ඉහත ප්‍රකාශය ආශ්‍රයෙන් අත් අඩංගුවට ගත් පුද්ගලයන්ගේ මූලිකම අයිතිවාසිකම් පිළිබඳව විමර්ශකයන්ට එහි ඇති වැදගත්කම සහ වරෙන්තුවක් රහිතව පුද්ගලයකු අත් අඩංගුවට ගත හැකි තත්ත්වයක් සහ එසේ අත් අඩංගුවට ගැනීමට කුමක් හේතුවේද යන්න සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර අදාළ නඩු නීතිය පිළිබඳ සාකච්ඡාවන් මගින් සහය දෙන්න.

07. ලතා බරපතල තුවාල සහිතව කමත මත වැතිර සිටියදී හමුවිය. ධර්මසේන සහ සුමතිපාල ඇය කරා පැමිණි අතර මුල් තැනැත්තා ඇයගෙන් කුමක් සිදුවේදැයි අසා සිටියේය. ලතා බෙලහීනව උච්චාරණය කරන ලද්දේ "*මාව දූෂණය කලා මා එයට එරෙහි වුන නිසා බරපතල ලෙස පහර දුන් බවයි.*" සුමතිපාල එවිට අසා සිටියේ වරදකරු කවරෙක්ද යන්නයි. උගුරට සිදුව තිබූ තුවාල උග්‍ර වී ඇති නිසා ඇයට පිළිතුරු දිය නොහැකි විය. එවිට නැවත වරක් සුමතිපාල ඇගෙන් අසා සිටයේ "*මෙය සිදු කරන ලද්දේ බොනී මහත්මයා විසින්ද යන්නයි.*" ලතා එය ස්ථිර කරන ලද අතර එයට පසු එකිනෙහිම ඇය මරණයට පත්විය.

සිද්ධියට සතියකට පෙර ලතා සුමතිපාලට ප්‍රකාශ කරන ලද්දේ බොනී මහත්මයා නැමැති අය ඇයට අයුතු යෝජනාවක් ගෙන ආ අතර ඔහු සමග ඇයට ලිංගිකව හැසිරීමට ආරාධනා කල බවත් ඇය කෙලින්ම එය ප්‍රතික්ෂේප කල බවයි. ලතා දූෂණය හා ඝාතනය කිරීම පිළිබඳව බොනී මහත්මයාට එරෙහිව පසුව ගෙන ආ නඩු විභාගයේදී පැමිණිලි පාර්ශවයට අවශ්‍ය වන්නේ මෙකී ප්‍රකාශයන් සහ සිදුවීම වූ ස්ථානයේ ලතා විසින් ධර්මසේන හා සුමතිපාල වෙත කරන ලද හිස සෙලවීමෙන් දක්වන ලද ක්‍රියාව හා එකී සිදුවීමට සතියකට පෙර කරන ලද අයුතු යෝජනාව නඩු විභාගයේ දී මෙහෙයවීමටය. මහත් පරිශ්‍රමයක් දරා විත්ති පාර්ශවය එකී සාක්ෂිවලට විරුද්ධ වීමට පදනම වූයේ සාක්ෂි ආඥාපනත මගින් ඒවායේ අදාලත්වයට හා පිළිගැනීමට අවසර දී නොමැති නිසාය.

නඩු නීතිය සහ අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් අභියෝදක පාර්ශවයේ ඉල්ලීමේ වලංගුතාවය සහ විත්ති පාර්ශවයේ විරෝධතාවයන් සාකච්ඡා කරන්න.

○○○○○○○○○○○○○○